# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1855/38 - 2014 මාර්තු මස 27 වැනි බ්‍රහස්පතින්දා - 2014.03.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනතින් සංශෝධිත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් සභා රාජ්‍ය සේවයේ බලතල පැවරීම සම්බන්ධයෙන් වූ නියමයයි**

බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර සෙයිද් අලවි මව්ලානා වන මම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හා 1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනතින් සංශෝධිත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත 01 උපලේඛණයේ විස්තර කර ඇති බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තනතුරු සම්බන්ධයෙන් නිලධරයන් පත්කිරීම, මාරු කිරීම (තනතුරින් මුදා හැරීම ඇතුලත්ව) සම්බන්ධයෙන් වන බලතල ද, පහත 02 උපලේඛනයෙහි විස්තර කර ඇති පළාත් සභා රාජ්‍ය සේවයේ තනතුරු සම්බන්ධයෙන් නිලධරයන් පත්කිරීම, මාරු කිරීම (තනතුරින් මුදා හැරීම ඇතුලත්ව) සම්බන්ධයෙන් වන බලතල මවිසින් ක්‍රියාත්මක කිරීමට යටත්ව එම බලතල හැර එකී 01 හා 02 උපලේඛනයන්ට අදාළ තනතුරු සම්බන්ධයෙන් වන විනය පාලනය හා සේවයෙන් පහ කිරීම ආදී සෙසු බලතල (අදාළ වන පමණට) හා බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ සෙසු සියළු තනතුරු සම්බන්ධයෙන් පත්කිරීම, මාරුකිරීම, සේවයෙන් පහකිරීම, ඔවුන්ගේ විනය පාලනය සම්බන්ධයෙන් වන බලතල 2014ක් වූ මාර්තු මස 31 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත මෙයින් පවරා දෙමි.

තවද පහත 02 උපලේඛනයෙහි සඳහන් තනතුරු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විනය පාලනය හා සේවයෙන් පහ කිරීම සම්බන්ධයෙන් වන බලතල ක්‍රියාත්මක කිරීමකදී හැර, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ සෙසු තනතුරු සම්බන්ධයෙන් ඉහතින් පවරා දෙන්නට යෙදුනු බලතල ක්‍රියාත්මක කිරීමකදී අතෘප්තියට පත්වන අයෙකුට බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයා වෙත අභියාචනය කිරීමට අයිතිවාසිකම් ඇති බවටත් මෙයින් නියමකොට ප්‍රකාශ කරමි. තවද, මෙසේ පවරා දෙන බලතල සම්බන්ධයෙන් 1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධිත) පනතින් සංශෝධිත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(2අ) උප වගන්තිය යටතේ සඳහන් බලතල අනුව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාකිරීමේදී ඒ සම්බන්ධයෙන් විශේෂිතව මවිසින් නියමයන් නොකරන තාක් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි එම බලතල බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් හෝ යම් නිලධරයෙකු වෙත පවරාදීම සඳහා මෙයින් බලය හා අවසරය දෙමි.

තවද, මෙම බලතල පැවරීම ක්‍රියාත්මක වන දිනට පෙර දිනෙන් ක්‍රියාත්මක වන පරිදි බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ බලතල පැවරීමට අදාළ අංක 1815/12 හා 2013 ජුනි මස 20 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ මවිසින් නිවේදනය කරන්නට යෙදුණු 2013 ජුනි මස 10 දිනැති නියමය, එකී නියමය යටතේ මේතාක් ගන්නා ලද කිසිදු ක්‍රියාමාර්ගයකට අගතියක් නොවන පරිදි මෙයින් පරිච්ඡින්න කරමි.

එස්. අලවි මව්ලානා,
බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර.

2014 මාර්තු මස 24 වැනි දින,
කොළඹ 05,
හැව්ලොක් පාර,
අංක 98/4,
බස්නාහිර පළාතේ ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ දී ය.

1A - PG 002013— 110 (2014/03)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

01 උපලේඛනය

* බස්නාහිර පළාතේ ආණ්ඩුකාර ලේකම්
* බස්නාහිර පළාතේ පළාත් සභා ලේකම්
* බස්නාහිර පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්
* බස්නාහිර පළාතේ පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්
* බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්
* බස්නාහිර පළාතේ පළාත් සභාවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් (අධ්‍යාපන දෙපාර්තමේන්තුව හැර)
* බස්නාහිර පළාතේ මහනගර සභාවල නාගරික කොමසාරිස්වරුන්
* බස්නාහිර පළාතේ කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
* බස්නාහිර පළාතේ කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්කවල පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන්
* බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක
* බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී (ගිණුම් හා ගෙවීම්)
* බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී (අයවැය)
* බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී (මුදල් හා ආදායම්)
* බස්නාහිර පළාතේ මානව සම්පත් සංවර්ධන හා කළමනාකරණ පුහුණු ආයතනයේ අධ්‍යක්ෂ
* බස්නාහිර පළාතේ ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ සහකාර ලේකම්වරුන්
* බස්නාහිර පළාතේ ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ නීති නිලධාරී

02 උපලේඛණය

* බස්නාහිර පළාතේ අධ්‍යාපන අධ්‍යක්ෂ
* බස්නාහිර පළාතේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
* බස්නාහිර පළාතේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

04 - 346

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.